1[st] Place Winner
National Productivity
Award 2020

ISO 9001 SYSTEM CERTIFIED SLSI
SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/06/04/2024(45) | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2024.06. 24 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, සභා ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

## වාර්ෂික ස්ථාන මාරු - 2024

2024 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද 2023.12.01 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 03/2023 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව, දකුණු පළාත් සභාවේ සංවර්ධන නිලධාරී/ කළමනාකරණ සේවා නිලධාරී/ වැඩසටහන් සහකාර/ සංවර්ධන සහකාර/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර/ රියදුරු/ කාර්යාල සේවක සේවය යන සේවාවන්හි නිලධාරීන් සම්බන්ධයෙන් 2024 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩලයේ නිර්දේශ මත සකසන ලද අභියාචනා මණ්ඩල තීරණ මේ සමඟ අමුණා ඇති අතර, එම තීරණ <u>ප්‍රධාන ලේකම් නිල වෙබ් අඩවියට **(www.cs.sp.gov.lk)** මුදා හැර ඇති බව</u> කාරුණිකව දන්වමි.

- ඇමුණුම 01 - කළමනාකරණ සේවා නිලධාරී සේවයේ ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ
- ඇමුණුම 02 - මාගේ අංක CSS/03/06/03/04/2024(28) හා 2024.04.18 දිනැති ව ප්‍රසිද්ධ කරන ලද කළමනාකරණ සේවා නිලධාරී සේවයේ ප්‍රධාන ලේකම් ස්ථාන මාරු මණ්ඩල තීරණ ලේඛනයට, ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩලය විසින් සිදු කළ සංශෝධන
- ඇමුණුම 03 - සංවර්ධන නිලධාරී සේවයේ ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ
- ඇමුණුම 04 - මාගේ අංක CSS/03/06/03/04/2024(28) හා 2024.04.18 දිනැති ව ප්‍රසිද්ධ කරන ලද සංවර්ධන නිලධාරී සේවයේ ප්‍රධාන ලේකම් ස්ථාන මාරු මණ්ඩල තීරණ ලේඛනයට, ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩලය විසින් සිදු කළ සංශෝධන
- ඇමුණුම 05 - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර සේවයේ ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ
- ඇමුණුම 06 - රියදුරු සේවයේ ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ
- ඇමුණුම 07 - කාර්යාල සේවක සේවයේ ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

03. 2024 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ අභියාචනා මණ්ඩල තීරණ මගින් අවලංගු කරන ලද ස්ථාන මාරුවීම්, ක්‍රියාත්මක වන දිනය දීර්ඝ කරන ලද ස්ථාන මාරුවීම් හා මෙම ලිපියේ 08 වන ඡේදයේ පරිදි පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා යොමු කළ ස්ථාන මාරුවීම් හැර අනෙකුත් සියලු ස්ථාන මාරුවීම් **2024.07.11 දින සිට ක්‍රියාත්මක කරන ලෙස මෙයින් නියෝග කරමි.**

04. එසේම, ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දින වන විට ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියන්ගේ ස්ථාන මාරුවීම් **ප්‍රසූත නිවාඩු අවසන්ව පැමිණි දිනට සතියකට පසු** ක්‍රියාත්මක කළ යුතු ය.

05. ඒ අනුව, ස්ථාන මාරුවීම් ලබා ඇති කිසිදු නිලධාරියෙකු නියමිත දිනයෙන් පසුව නිදහස් නොකොට රඳවා නොගත යුතු අතර, අනුප්‍රාප්තික නිලධාරීන් පැමිණෙන තෙක් ඔවුන් රඳවා නොගෙන නව සේවා ස්ථානයන්හි රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි ඔවුන් සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කළ යුතුය.

06. එකී ස්ථාන මාරු වී යන නිලධාරීන්ගේ රාජකාරි ආයතන ප්‍රධානියා හෝ මාණ්ඩලික නිලධාරියෙකු විසින් නම් කරන නිලධාරියෙකුට භාර දී, නියමිත දිනයේදී නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අදාළ නිලධාරීන් සේවයෙන් නිදහස් කිරීම ඔබගේ වගකීම වන බව අවධාරණය කරන අතර; **නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්තිය ප්‍රකාරව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවද දන්වමි**.

07. එමෙන්ම, නියමිත දිනයේදී ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක නොකිරීම මත ඇතිවන ගැටළු සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් පෞද්ගලිකව වගකිව යුතු බව මින් අවධාරණය කරන අතර, **නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන්ගේ වැටුප් හා සියලු දීමනා ගෙවීම නතර කිරීමට පියවර ගන්නා ලෙස ද මින් නියෝග කරමි.**

08. ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ සම්බන්ධයෙන් අතෘප්තියට පත් නිලධාරීන්ට 2023.12.01 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 03/2023 හි අංක 09 ප්‍රකාරව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කළ හැක. ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩලයට අභියාචනා ඉදිරිපත් නොකළ, නියමිත ආකෘතියට පටහැනි හෝ නියමිත දිනට පසුව ලැබෙන අභියාචනා අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. ඒ අනුව, 03/2023 දරණ ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛයේ ආකෘති අංක 05 ප්‍රකාරව සකස් කරන ලද අභියාචනා අයදුම්පත්‍රය ආසන්නතම මාණ්ඩලික නිලධාරියා මගින් සෘජුවම **2024.07.10** දින මධ්‍යහන 12.00 ට පෙර හෝ ඊට ප්‍රථම මා වෙත ලැබීමට සැලැස්විය යුතු අතර **කිසිදු නිලධාරියෙකුට සෘජුවම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත සිය අභියාචනා අයදුම්පත්‍රය ඉදිරිපත් කල නොහැකි බව අවධාරණය කරමි.**

10. නිසි නිල මඟින් අභියාචනා ඉදිරිපත් කිරීමේදී ඇති වන ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා සෘජුවම ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත සිය අභියාචනා අයදුම්පත්‍රය යොමු කිරීමට ආයතන ප්‍රධානීන් විසින් අදාළ නිලධාරීන් හට අවස්ථාව සලසා දිය යුතු අතර, ඉන් අනතුරුව ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් එකී අයදුම්පත්‍ර සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ නිර්දේශ ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.

11. ඒ අනුව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතට අභියාචනා අයදුම්පත් යොමු කරන නිලධාරීන්ගේ ස්ථාන මාරු එම කොමිෂන් සභාවේ තීරණ දැනුම් දෙන තුරු තාවකාලිකව අත්හිටුවනු ලබන අතර, ඒ බැව් එකී ස්ථාන මාරු ගැලපුමට අදාළ අනෙකුත් සියලු නිලධාරීන්ගේ ආයතන ප්‍රධානීන් හට දැනුම් දීමට 2024.07.10 දින ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් කටයුතු කරනු ලැබේ.

12. එසේම, මා විසින් නිකුත් කරන ලද අංක 03/2023 හා 2023.12.01 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛය (පාලන) ප්‍රකාරව, මෙම 2024 වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල තීරණවල මුද්‍රිත පිටපත් දකුණු පළාත් සභාවේ සියලු ආයතන වෙත යොමු නොකරන බව කාරුණිකව දන්වා සිටිමි.

13. එබැවින්, ඔබ අමාත්‍යාංශයට/දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියලුම ආයතනවල නිලධාරීන් වෙත ද 2024 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ ප්‍රධාන ලේකම් මාරු මණ්ඩලයේ හා අභියාචන මණ්ඩලයේ නිර්දේශ මත සකසන ලද ස්ථාන මාරු තීරණ නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

**සුමිත් අලහකෝන්**
**ප්‍රධාන ලේකම්**
**දකුණු පළාත**

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

<u>පිටපත් :</u>

| | |
|---|---|
| 01. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත. | - දැ.ගැ.ස / අ.ක.ස. |
| 02. සහකාර විගණකාධිපති, ජාතික විගණන උප කාර්යාලය | - දැ.ගැ.ස. |
| 03. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය | -2024 වාර්ෂික ස්ථාන මාරුවීම්වල ප්‍රගතිය මසක් ඇතුළත මා වෙත දැනුම් දීමට අ.ක.ස. |

ආකෘති අංක 05

## 2024 වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම

අභියාචක නිලධරයා පිළිබඳ තොරතුරු

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. මුලකුරු සමග නම :- | | | |
| 02. තනතුර හා පන්තිය :-<br>(ශ්‍රේණිය) | | | |
| 03. උපන් දිනය :-<br>අවුරුදු/ මාස/ දින | | 04. වයස :- අවු .......<br>මාස ...... දින ........<br>(2024.06.02 දිනට) | |
| 05. ජාතික හැඳුනුම්පත් අංකය :- | | 06. ස්ත්‍රී පුරුෂ භාවය | |
| 07. ස්ථිර ලිපිනය :- | 08. තාවකාලික ලිපිනය :- | 09. දුරකථන අංකය කාර්යාලය:<br>පෞද්ගලික: | |
| 10. විවාහක අවිවාහක බව :- | 11. කලත්‍රයාගේ නම :- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :- | |
| 13. දරුවන් ගණන :- | 14. 2024.06.02 දිනට ඔවුන්ගේ වයස :- | 15. ඉගෙනුම ලබන පාසල් :- | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

ආ.) සේවා තොරතුරු

| | | | |
|---|---|---|---|
| 16. මුල් පත්වීම් දිනය :- | | 17. වර්තමාන තනතුරට පත් වූ / අන්තර්ග්‍රහණය වූ දිනය :- | |
| 18. වර්තමාන ශ්‍රේණියට උසස්වීම් ලැබූ දිනය :- | | | |
| 19. වර්තමාන නිත්‍ය සේවා ස්ථානය :- | | 20. නිත්‍ය සේවා ස්ථානයේ ලිපිනය :- | |
| 21. පිහිටි නගරය / උප නගරය :- | | 22. අනුයුක්ත කර ඇත්නම් එම සේවා ස්ථානය :- | |

| | | | |
|---|---|---|---|
| 23. වර්තමාන නිත්‍ය සේවා ස්ථානය අයත් අමාත්‍යාංශය :- | | 24. දෙපාර්තමේන්තුව :- | |
| 25. ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කර තිබේද යන්න හා සේවය කර ඇත්නම් එම සේවා ස්ථානය :- | | | |

26. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන (වර්තමාන සේවා ස්ථානයේ සිට අනුපිළිවෙලින් සඳහන් කරන්න.)

| සේවා ස්ථානය | ප්‍රියමනාප සේවා ස්ථානයකි/ ප්‍රියමනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

**ඇ.) වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු**

| | | |
|---|---|---|
| 27. වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමේදී ස්ථාන මාරු අපේක්ෂා කර ඇත්ද නැත්ද යන්න :- (✓ ලකුණ යොදන්න) | ඇත | |
| | නැත | |

28. ස්ථාන මාරු අපේක්ෂා කර ඇත්නම්, අයදුම් කර ඇති සේවා ස්ථාන :-
1.
2.
3.
4.
5.

| | |
|---|---|
| 29. වාර්ෂික ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය :- | |
| 30. ස්ථාන මාරු චක්‍රය සමන්විත වන නිලධාරීන් සංඛ්‍යාව :- | |

| | | |
|---|---|---|
| 31. වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර ඇත්ද නැත්ද යන්න :- (✓ ලකුණ යොදන්න) | ඇත | |
| | නැත | |

32. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම පිළිබඳ තොරතුරු :-

| | |
|---|---|
| ස්ථාන මාරුව අවලංගු කිරීම | |
| සංශෝධනය කිරීම | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | |

33. ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කළ සේවා ස්ථාන :-
1.
2.
3.

| | |
|---|---|
| 34. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය :- | |

| |
|---|
| 35. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු :-<br>1.<br>2.<br>3. |
| 36. ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.<br>ඇමුණුම 01 ................................................<br>ඇමුණුම 02 ................................................<br>ඇමුණුම 03 ................................................ |
| 37. ඉල්ලා සිටිනු ලබන සහන :-<br>1.<br>2.<br>3. |

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

.................................................. ..................................................

දිනය අත්සන

**ඇ.) ආයතන ප්‍රධානියාගේ / දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය**

| |
|---|
| 38. ප්‍රධාන ලේකම්, දකුණු පළාත.<br>i. ........................................................................ විසින් අනු අංක 01 සිට 26 දක්වා සම්පූර්ණ කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවට සහතික කරමි.<br>ii. ........................................................................ගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු (සහිතව/ රහිතව/පසුව ලබා ගැනීමේ පදනම මත) නිර්දේශ කරමි / නිර්දේශ නොකරමි.<br><br>.............................. ...............................................<br>දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව |
| 39. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්, දකුණු පළාත.<br>i. ස්ථාන මාරු චක්‍රය සම්බන්ධ වන නිලධාරීන් ගණන :-<br>ii. අභියාචනය පිළිබඳ නිර්දේශය :-.<br><br>.............................. ...............................................<br>දිනය දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව |